බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර පරීක්ෂණය – **2018**
Second Term Test – 2018
இரண்டாம் தவணை பரீட்சை -2018

10 **වසර** *தரம்* 10 Grade 10	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය **I** පත්‍රය தகவல் தொடர்பாடலும் தொழினுட்பவியலும் வினாத்தாள்-I Information & Communication Technology Paper I	**පැය එකයි** *ஒரு மணித்தியாலம்* *One Hours*

සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

1. "පසු ගිය වැසි සමයේ **එක් එක් පළාත ලද වර්ෂාපතන** අනුව **වැඩිම වර් ෂාපතනයක් ලැබී ඇති පළාත** වන්නේ සබරගමු පළාතයි". මෙම ප්‍රකාශයේ කළු අකුරින් මුද්‍රිත ප්‍රකාශයන් දෙක සඳහා සුදුසු යෙදුම් වන්නේ පිළිවෙලින්

1. තොරතුරු (**Information**) / දත්ත (**Data**) **2.** තොරතුරු / තොරතුරු
3. දත්ත / තොරතුරු **4.** දත්ත / දත්ත

2. පහත කුමන උපාංගය චිත්‍රක පරිශීලක පරිසරයක පිළිගත් සම්මත ලක්ෂීය ආදාන උපාංගය වේද?

1. යතුරු පුවරුව (Keyboard) **2.** මූසිකය (Mouse)
3. මෙහෙයුම් යටිය (Joystick) **4.** ප්‍රකාශ පෑන (Light Pen)

3. යම් භාණ්ඩයක් පිළිබඳ තොරතුරු ඇතුලත් වෙබ් අඩවිය දර් ශණය කර ගැනීම සඳහා ස්මාර් ට් ජංගම දුරකථනයක් මගින් සුපරීක්ෂණය කරගත හැකි අදාල භාණ්ඩය මත ඇති කේතය වන්නේ...

1. තීරු කේතය (Bar code) **2.** QR කේතය (QR code)
3. ඇස්කි කේතය (ASCII code) **4.** විකේතනය (Decode)

4. පහත සඳහන් යුගල අතර වැරදි පිළිතුර තෝරා ගන්න

1. ආදාන / ප්‍රතිදානය - ස්පර්ශ තිරය
2. බහුවර්ණ ප්‍රශ්ණ පත්‍ර සලකුණු කිරීම- **OCR**
3. ද්විතියික ආචයන උපාංග- වාෂ්පශීලී නොවන
4 නියමු නොවන මාධ්‍ය - අධෝරක්ත

5. අද අප භාවිතා කරන පරිඝනකයේ මූලික අඩිතාලම වූයේ **A)..........................**දී ඉංග්‍රීසි ජාතික ගණිත මහචාර්යය **B).......................................**විසින් නිර්මානය කල **C)..** .යන්ත්‍රයේ සැලස්මයි

1. A) 21 වන සියවසේ	B) Charles Babbage	C) Difference Engine
2. A) 19 වන සියවස	B) Blaise Pascal	C) Analytical Engine
3. A) 19 වන සියවස,	B) Charles Babbage	C) Analytical Engine
4. A) 20 වන සියවසේ	B) ජෝසෆ් ජැක්වාඩ්	C) Adding machine

6. පහත රූපය සලකන්න



රූපයට අනුව පරිඝනක පද්ධතියක ප්‍රධාන අංග පිළිවෙලින්

1.	A-ආදාන	B- සැකසීම	C- ප්‍රතිදානය
2.	A-ආදාන	B- ප්‍රතිදාන	C- සැකසීම
3.	A-ප්‍රතිදානය	B- සැකසී	C-ආදාන
4.	A-ප්‍රතිදාන	B- ආදාන	C- සැකසීම

7. පහත සඳහන් ඒවායින් කුමන ක්‍රියාවලිය කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ නොවේද?

1. නැවතුම් හැඳුනුම් අවසරපත
2. ස්වයංක්‍රීය ජල සැපයුම (**Drip irrigation**)
3. ස්වයංක්‍රීය වල් පැළ ඉවත්කරණය
4 ස්වයංක්‍රීය කුරුමිණි පාලන යන්ත්‍රය

8. **BIOS** යනු පඨන මාත්‍ර මතකයකි **(ROM)**.

i. එය නශ්‍ය (**volatile**) මතකයකි.
ii. එයට සසම්භාවී ලෙස ප්‍රවේශ විය හැක.
iii. එය මව් පුවරුව මත ස්ථාපනය වී ඇත.
iv. එහි bootstrap loader නම් ක්‍රමලේඛය අඩංගු වේ.

1. i සහ iii පමණි
2. i, ii සහ iv පමණි
3. ii, iii සහ iv පමණි
4. iii සහ iv පමණි

9. පහත විස්තර කිරීම් වලට ගැලපෙන දෘඩාංග කොටස් වන්නේ පිළිවෙලින්**.**

- මධ්‍ය සැකසුම් ඒකකයේ (**CPU**) කොටසකි.
- ස්ථිරාංග (firmware) අඩංගු මතකයකි.
- ඇඹරූ කම්බි යුගල භාවිත වන පරිගණක ජාල සම්බන්ධ කිරීමේ දී යොදා ගන්නා කෙවෙනියකි.

1. RJ 45 / ROM / ALU
2. ROM / ALU / RJ 45
3. ALU / ROM / RJ 45
4. ALU / RJ 45 / ROM

10. විද්‍යුත් තන්තු රේඛීය යන්ත්‍රය (ECG) උදාහරණයක් වන්නේ පහත කවර ගණයටද?

1. ප්‍රතිසම උපක්‍රම (Analog device).
2. අංකිත උපක්‍රම (Digital device)
3. මිශ්‍ර උපක්‍රම (Hybrid device)
4. ඉහත කිසිවකට නොවේ**.**

11. බූලියානු ගණිත කර්මය **(1 . 0 + 1 . 0 + 0) .1** සමාන වන්නේ

1. **1** **2.** **0** **3.** **2** **4.** ඉහත කිසිවකට නොවේ.

12. පැතුරුම්පත් (**spreadsheet**) මෘදුකාංගය හා එකඟ නොවන සමීකරණය වන්නේ

1. = (BB1 * 5) + B32
2. =Sum (3NB1 + CC1)
3. = BK1 + (CA3 ^ 2 -1)
4. =Sum (AM3:AN2,AP1.+ 30

13. අමල් තම ස්මාර් ට් ජංගම දුරකථනයේ ඇති ඡායාරූප කිහිපයක් තම උකුල් පරිගණයට මාරු කිරීමට භෞතික මාධ්‍යයක් භාවිත කිරීමකින් තොරව කැමරාව උකුල් පරිගණකයට සම්බන්ධ කරයි. පහත දැක්වෙන සන්නිවේදන මාධ්‍ය සහ ජාල ආකාර අතුරින් කුමක්/කුමන ඒවා ඉහත කාර් යය සඳහා සම්බන්ධ වී ඇතිද?

A – නියමු මාධ්‍ය (**Guided media**)
B –නියමු නොවන හෙවත් විකිරණ මාධ්‍ය (**Unguided media**)
C – ස්ථානීය ප්‍රදේශ ජාල (**Local area**)
D – පුළුල් ප්‍රදේශ ජාල (**Wide area**)

1. **A** සහ **B** පමණි   **2.** **A** සහ **C** පමණි
3. **B** සහ **C** පමණි   **4.** **B** සහ **D** පමණි

14. $AC8_{16}$ **යන ෂඩ් දශමය සංඛ්‍යාව නිරූපණය සඳහා අවශ්‍ය අවම බිටු ප්‍රමාණය වන්නේ**

1. **තුනකි**   2. **දහසයකි**   3. **නවයකි**   4. **දොළහකි**

15. 10110101_2 **යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව වන්නේ**

1. 181   2. 118   3. 05   4. 139

16. පහත ප්රකාශ සලකා බලන්න.

A - $\mathbf{4C_{16}}$ යන ෂඩ් දශමය සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව වන්නේ 412_{10}කි.
B - දශමය 54 සඳහා තුල්‍ය ද්විමය සංඛ්‍යාව වන්නේ $\mathbf{110110_2}$ යි.
C - $\mathbf{10110110_2}$යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටමය සංඛ්‍යාව$\mathbf{266_8}$ යි.
ප්‍රකාශ වලින් සත්‍ය වන්නේ

1. **A** හා **B** පමණි   **2.** **A** හා**C only** පමණි   **3.** **B** හා **C** පමණි   **4.** **A, B** හා **C** සියල්ලම

17. 64.20 යන දශම සහිත සංඛ්යාවට අදාල වැඩිම වෙසෙසි සංඛ්යාංකය හා අඩුම වෙසෙසි සංඛ්‍යාංකය වන්නේ

1. 6 සහ 0   2. 4 සහ 2   3. 6 සහ 2   4. 64 සහ 20

18. මෙගා බයිට් 3 ක අන්තර්ගතයට සමාන වන්නේ

1. 2^{20} Bytes   2. 3×2^{20} Bytes   3. 3 X 1024 Bytes   4. 2 X 2 X 2 1024 Bytes

19. **" A"** හි **ASCII** වටිනාකම 65 වේ නම් **" C"** හි **ASCII** කේතය වන්නේ

1. 1000001_2 2. 1000010_2 3. 1000011_2 4. 1101011_2

20. **BCD** හි වලංගු බිටු රටාවක් වන්නේ පහත ඒවායින් කවරක්ද ?

1. 1010   2. 1100   3. 1001   4. 1101

21. පහත දී ඇති තර්කන පරිපථයේ ප්‍රතිදානය වන්නේ



1. A + B.B   2. (A. B)' .B   3. (A' + B') + B   **4.** (A'. B') .B

22. විභාගයකින් සුදුසුකම් ලැබීම සඳහා **S_1** නම් වූ අනිවාර්යය විෂය සමග **S_2, S_3** හා **S_4** යන අතිරේක විෂයන් 3 න් එකක් සමත් වීම අවශ්‍ය වේ. මෙම සිද්ධිය නිවැරදිව නිරූපණය කරනු ලබන බූලියානු ප්‍රකාශය වන්නේ

1. S_1 AND (S_2 OR S_3 0R S_4)
2. S_1 AND (S_2 AND S_3 AND S_4)
3. S_1 OR (S_2 AND S_3 AND S_4)
4. S_1 OR (S_2 OR S_3 OR S_4)

23. පහත තර් ක පරිපථය සලකන්න.



ඉහත තර් ක පරිපථ සටහනට සමාන වන්නේ පහත කුමන තර් ක පරිපථ සටහන ද?

1.


2.


3.


4.


24. **{0, 1, 2, 3, 4}** යන සංඛ්‍යාංක කුලකය මගින් නිරූපණය කරනු ලබන සංඛ්‍යා පද්ධතියේ පාද අගය වන්නේ කුමක් ද?

1. 4 2. 8 3. 10 4. 5

25. බූලියානු වීජ ගණිතයට අනුව 1+1 හි අගය සමාන වන්නේ කුමන අගයට ද?
1. 11 2. 10 3. 2 4. 1

26. **(2*4) = (12-4)** ගණනය කිරීම සිදු කරනු ලබන්නේ මධ්‍ය සැකසුම් ඒකකයේ (**CPU**) කුමන කොටස මගින්ද?
රෙජිස්තර (**Register**) **2.** පාලන ඒකකය (**CU**)
3. ගණිත හා තර් ක ඒකකය (**ALU**) **4.** සංචායකය (**Accumulator**)

27. උපස්ථ පිටපත් තබා ගැනීම සඳහා වඩාත් කාර් යක්ෂම ලෙස භාවිත කල හැකි පරිගණක උපක්‍රමය වන්නේ පහත ඒවායින් කවරක්ද?

1. සංයුක්ත තැටි (**Compact Disk**) **2.** සේවා දායක දෘඪ තැටිය (**Server Hard Disk**)
3. මෘදු තැටි (**Floppy Disk**) **4.** **128 MB SD** මතකය

28. පරිගණකයේ පියා ලෙස විරුදාවලි ලද පුද්ගලයා වන්නේ

1. චාර් ල්ස් බැබේජ් (**Charles Babbage**) **2.** බ්ලෙයිස් පැස්කල් (**Blaise Pascal**)
3. ගොඩ්ෆ්‍රිඩ් විල්හෙල්ම් (**Gottfried Wilhelm**) **4.** හර් මන් හොලෙරිත්(**Herman Hollerith**)

29. පැතුරුම්පත් වැඩ පතකට ඇතුලත් කල හැකි දත්ත ආකාර වන්නේ **….**
1. දත්ත (**data**)**,** වචන (**words**)**,** සංඛ්‍යා (**numbers**)
2. සමීකරණ (**equations**)**,** දත්ත**,** සංඛ්‍යා

3. වචන, සංඛ්‍යා, ලේබල (**labels**)
4. සංඛ්‍යා, සමීකරණ, ලේබල

30. පැතුරුම්පතක් භාවිතා කිරීමේදී වැඩකටයුතු පහසු කරගැනීම සඳහා කෙටිමං යතුරු භාවිතා කරයි .**Ctrl + H** යන යතුරු සංයෝජනයෙන් සිදුකරගත හැකිවනුයේ

1. ලේඛනයක් විවෘත(**open**) කිරීම.
2. කර්සරය(**curser**) ලේඛනයේ මුලට ගැනීමට ගැනීමට.
3. පැතුරුම්පතක වචන ප්‍රතිස්ථාපනය(**replace**) කරීමට.
4. ඉහත කිසිවක් සඳහා නොවේ.

31. පැතුරුම්පතක සක්‍රිය කෝෂයක් (**Active cell**) ලෙස හඳුන්වනු ලබන්නේ
1. ශ්‍රිතයක්)**Formula)** යොදා ඇති කෝෂයකි.
2. සමීකරණයක් (**Function**) යොදා ඇති කෝෂයකි.
3. තෝරාගෙන(**Selected**) ඇති කෝෂයකි
4. තෝරාගෙන(**Selected**) ඇති කෝෂ සමූහයකි .

32. පහත දැක්වෙන්නේ පැතුරුම්පත් තුල භාවිතාකරන ශ්‍රිත කිහිපයකි. ඉන් වැරදි ශ්‍රිතය වන්නේ
1. =SUM(A1:A10,B2)
2. =MAX(AA1:AB5,AC3)
3. =MIN (D5:D10)
4. =COUNT(5C: 20C)

33. මෙම පැතුරුම්ත් කොටසෙහි **B6** කෝෂයට එක් එක් වයස්වල සාමාන්‍ය අගය ගණනය කල යුතුය. ඒ සඳහා වන නිවැරදි ශ්‍රිතය වනුයේ,

1. =AVARAGE (B2:B5)
2. =AVG (B2:B5)
3. =AVERAGE(B2:B5)
4. ඉහත කිසිවක් නොවේ.

	A	B	C
1	Name	Age	
2	Kamal	35	
3	Sunil	40	
4	Geetha	27	
5	Pasan	17	
6			

34. =2+2^2*2 මෙම පැතුරුම් පත් සමීකරණයේ ප්‍රතිදානය කුමක්ද? .
1. 32 2. 16 3. 18 4. 10

35. පහත සඳහන් ඒවායින් වදන් සැරසිල්ලක් යෙදීමට භාවිත කල හැක්කේ කුමක්ද / කුමන ඒවාද?

a)

b)

c) 

1. a පමණි.
2. b පමණි.
3. a සහ b පමණි.
4. a සහ c පමණි.

36. වදන් සැකසුම් මෘදුකාංගයක දී ඡේදයක මැද එකෙල්ල (**align**) කිරීමට භාවිත වන මෙවලම වන්නේ

1.
2.
3.
4.

37. ………………………. **යනු වළාකුළු පරිගණක සඳහා සහය දෙන වදන් සැකසුම් මෘදුකාංගයක් වේ.**

1.	Open office.org writer	2.	Kingsoft office writer
3.	Google Docs	4.	Microsoft Word

38. **……………………. යනු වදන් වළාකුළු පරිගණක ආශ්‍රිත වදන් සැකසීමේ මෘදුකාංගයකි. හිස් තැනට සුදුසු යෙදුම වන්නේ**

1.	Open office.org writer	2.	Kingsoft office writer
3.	Google Docs	4.	Microsoft Word

39. **කැපීම (cut)** සහ ඇලවීම (**paste**) සඳහා භාවිත වන කෙටි මං යතුරු අඩංගු වන්නේ පිළිවෙලින් කුමන පිළිතුරෙහිද?

1.	Ctrl + c and Ctrl + p	2.	Ctrl + x and Ctrl + p
3.	Shift + c and Shift + p	4.	Ctrl + x and Ctrl + v

40. වදන් සැකසුම් මෘදුකාංගයක් සම්බන්ධව වැරදි ප්‍රකාශය තෝරන්න ?

1. ලේඛණයක් යතුරු ලියනය කිරීම සහ සංස්කරණය කිරීමේ හැකියාව.
2. ගබඩා කල ලේඛණයක් නැවත ලබා ගැනීමේ හැකියාව.
3. ලේඛණයක් මුද්‍රණය කිරීමේ හැකියාව.
4. ලේඛණයේ ඕනෑම ස්ථානයක ගණනය කිරීමේ හැකියාව.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර පරීක්ෂණය – 2018
Second Term Test – 2018
இரண்டாம் தவணை பரீட்சை -2018

10 වසර *தரம்* 10 Grade 10	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය II පත්‍රය தகவல் தொடர்பாடலும் தொழினுட்பவியலும் வினாத்தாள்-II Information & Communication Technology Paper II	පැය දෙකයි *இரு மணித்தியாலம்* *Two Hours*

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

1. පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

i. සමන් තමා මිලදී ගැනීමට බලාපොරොත්තු වන කමිසය මුදල් අයකැමි වෙත ඉදිරිපත් කරන ලදී. මුදල් අය කැමි ඒහි සඳහන් තීරු කේතය, තීරු කේත කියවනයක් මගින් සුපරීක්ෂණය කරන ලදී. එවිට පරිගණකය විසින් පද්ධතියට අදාල දත්ත පාදකය පිරික්ෂා කමිසයේ මිල තිරයේ අදාල අයිතමය ඉදිරියෙන් සටහන් කරන ලදී. මෙහි සඳහන් ආදානය ක්‍රියාවලිය හා ප්‍රතිදානය හඳුනා ගන්න.
.

ii. මධ්‍යම සැකසුම් ඒකකයේ ප්‍රධාන කොටස් තුන කුමක්ද?

iii. හිස්තැනට ගැලපෙන යෙදුම සඳහන් කරන්න.

ඉහත ....කේතය සුපරීක්ශණය සඳහා නවීන ජංගම දුරකතන භාවිතා කල හැක

iv. දී ඇති උදාහරණය ඉ රාජ්‍ය සේවා සම්බන්ධය හා ගලපන්න.

A. වාහන බලපත්‍ර අළුත් කිරීම	G2E
B.ආගමන විගමන රෙගුලාසි	G2C
C.වැටුප් පද්ධති පිළිබඳ තොරතුරු	G2B
D.ඊ-බැංකුකරණය පිළිබඳ තොරතුරු	G2G

v. පහත දැක්වෙන රූප හඳුනාගෙන අදාල ලේබලය සමඟ සඳහන් කරන්න

A)

B)

vi. 1011111010101_2 යන ද්විමය සංඛ්‍යාවට අනුරූප ෂඩ් දශමය සංඛ්‍යාව සොයන්න.ඔබේ ගණනයට අදාල පියවර දක්වන්න.

vii. ASCII කේත ක්‍රමයේදී “A” අක්ෂරයට අදාල ASCII වටිනාකම 65 ක් වන අතර “C” හි ASCII වටිනාකම 67 කි.එම අගයන් ඇසුරෙන් CAB යන වචනය ද්විමයකේත ඇසුරෙන් ASCII කේත ක්‍රමයට ආකේතනය කර දක්වන්න.

viii. පහත බූලියානු ප්‍රකාශනයට අදාල තාර්කික පරිපථ සටහන ඇඳ දක්වන්න.

$$((A.B.C)+(A.B').(A'+C'))'$$

ix. පහත වදන් සැකසුම් කෙටි මං යතුරු හඳුනාගෙන අදාල ලේබලය ඉදිරියෙන් දක්වන්න.

A. Ctrl + A
B. Ctrl + S
C. Ctrl + V
D. Ctrl + Z

x. පහත පැතුරුම් පතට අදාලව දී ඇති ප්‍රකාශණ වල ප්‍රතිදානය සොයන්න

	A	B	C	D
1	7	5	4	2
2	3	1	9	4
3	6	2	4	8

A. =A1+2*C2/B2-B3

B. =B3^(A3-C3)/B3

2. පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

1) පහත දැක්වෙන ලැයිස්තුවෙන් නිවැරදි වචනය තෝරා අදාල ලේබලය සමඟ පිළිතුරු පතෙහි දක්වන්න (coeixal කේබල් / WiFi / චන්ද්‍රිකා සම්ප්‍රේෂණය / ෆයිබර් ඔප්ටික්)

A)



B)



C)



D



2) දත්ත සම්ප්‍රේශණ මාදිලි (Data communication modes) තුන දක්වා ඒ එක් එක් මාදිලි සඳහා එක් උදාහරණයක් බැගින් ලියන්න (03).

3) මුදුව (ring) සහ තරුව (stsr) ජාල ස්ථල වර් ග දෙකක් වේ. එක් වාසියක් සහ එක් අවාසියක් බැගින් ස්ථල (topology) ආකාර දෙකටම ලියන්න (02)

4) පරිගණක ජාලයක වාසි හතරක් ලියන්න.

5) ගිනි පවුරක (Fire wall)) කාර් යය කෙටියෙන් දක්වන්න.

3.

A) පහත තාර් කික පරිපථ සටහන සලකන්න.



ඉහත තාර් කික පරිපථයට අදාල බූලියානු ප්‍රකාශය ලියා දක්වන්න.

B) A සිට D ලේබල පිටපත්කර දක්වා ඇති ප්‍රකාශයන් සත්‍ය (✓) හෝ අසත්‍ය (**X**) බව දැක්විය යුතු වේ.

A	2^{30} bytes ක් 1 TB කට සමාන වේ.

B	ඇස්කි (ASCII) කේත ක්‍රමයට අනුව එක අනු ලක්ෂණයක් නිරූපණයට බිටු 7 ක් දායක වේ.
C	ද්විමය 10111_2 අගය ෂඩ් දශමය 17_{16} අගයට සමාන වේ.
D	දොර දෙකක් සහිත බසයක ගමන් ගන්නා බස් මගියකුට ඉදිරි පස දොරෙන් හෝ පසුපස දොරෙන් බැස යා හැකිය. මෙය AND තර්කනය(logic) පැහැදිලි කල හැකි උදාහරණයකි.

C) පහත දී ඇති වගුව පිළිතුරු පත්‍රයට පිටපත් කරගෙන හිස්තැන් පුරවන්න .

Decimal Number	**Binary Number**	**Octal Number**	**Hexadecimal Number**
154	……………….	……………….	$9A_{16}$
……………….	111101111_2	……………….	……………….
……………….	……………….	……………….	19_{16}
234	11101010_2	……………….	……………….
1171	……………….	2223_8	……………….

4.

(A) රෝහල් පරිශ්‍රයක් ගින්නෙන් ආරක්ෂා කර ගැනීම සඳහා සංවේදක 3 ක් සහිත ගිනි ආරක්ෂණ පරිපථයක් නිර්මාණය කර ඇත. එය

- ගිනි දැල් සංවේදකයක්
- දූම සංවේදකයක්
- $90\,^0$ C ට වැඩි උෂ්ණත්ව වලට සංවේදී වන උෂ්ණත්ව සංවේදකයක් යන සංවේදක වර්ග 03 කින් සමන්විත වේ.

ගිනි දැල් සංවේදකය වෙනත් ඕනෑම සංවේදකයක් හා එක්ව ක්‍රියාත්මක වූ විට ගින්නක් බව අගවන අනතුරු සංඥාව නාද වේ.

(i) ඉහත තත්ත්ව සැලකිල්ලට ගෙන ඒ සඳහා ගැලපෙන තාර්කික පරිපථයක් ඇද දක්වන්න.

(ii) ඔබ අදින ලද තාර්කික පරිපථය සඳහා බූලියානු ප්‍රකාශනයක් ලියා දක්වන්න.

(iii) ලියන ලද බූලියානු ප්‍රකාශනය සඳහා සත්‍යතා වගුව අදින්න.

(B) අෂ්ටමය 57_8 සංඛ්‍යාව අනුරූප ෂඩ් දශමය සංඛ්‍යාව බවටපරිවර්තනය කරන්න. ඔබේ ගණනයට අදාල පියවරයන් ලියා දක්වන්න.

5. පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) පරිගණකයට බාහිර උපාංග සම්බන්ධ කිරීමේ දී USB කෙවෙනි භාවිත කිරීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

2) පළමු පරම්පරාවේ පරිගණක හා දෙවන පරම්පරාවේ පරිගණක අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

3) පරිගණකයක් මිල දී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 4 ක් සඳහන් කරන්න.

4) කැතෝඩ කිරණ නල (CRT) සංදර් ශක හා සැසඳීමේ දී ආලෝක විමෝචක දියෝඩ (LED) සංදර් ශක වල වාසි දෙකක් ලියා දක්වන්න.

5) පහත A වගුවේ ඇති උපාංගය B වගුවේ ඇති ඊට ගැලපෙන විස්තරය සමඟ ඉරි මගින් යා කරන්න. පිළිතුරෙහි ලේබල පමණක් යෙදීම ප්‍රමාණවත් වේ.

	A			B
P	මාර්ගකය (Router)		T	පරිගණක ක්‍රීඩා වල දී සහ වෙනත් භාවිත වලදී ක්‍රියාවන් පාලනය සඳහා ඇති උපාංගයකි.
Q	මෙහෙයුම් යටිය (Joy stick)		U	අන්තර් ජාලය හරහා ඒ හා සම්බන්ධ වී සිටින පරිශීලකයෙකු දැක ගැනීමට හෝ වීඩියෝ, ජායා රූප ආදිය ග්‍රහණය කර ගැනීමට .
R	මුද්‍රකය (Printer)		V	පරිගණක ජාල දෙකක් හෝ වැඩි ගණනක් අතර සම්බන්ධ තාවක් ඇති කර ගැනීමට
S	වෙබ් කැමරාව (Webcam)		W	ස්පර් ෂ කල හැකි ආකාරයේ ප්‍රතිදාන ලබා ගැනීමට.

6. පහත වදන් සැකසුම් ලේඛණය ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.



word Processing

To make your document look professionally produced, **WORD PROVIDES HEADER, FOOTER, COVER PAGE, AND TEXT BOX** designs that complement each other. For example, you can add a matching cover page, header, and sidebar. Click Insert and then choose the elements you want from the different galleries.

Themes and styles also help keep your document coordinated. When you click Design and choose a new Theme, the

pictures, charts, and **SmartArt graphics** change to match your new theme. When you apply styles, your headings change to match the new theme. Save time in Word with new buttons that show up where you need them. To change the way a picture fits in your document, click it and a button for layout options appears next to it. When you work on a table, click where you want to add a row or a column, and then click the plus sign.

Reading is easier, too, in the new Reading view. You can

- collapse parts of the document
- focus on the text you want.
- If you need to stop reading before you reach the end, Word remembers where you left off –

1) ඉහත ලේඛණයේ තීරු දෙකෙහි දක්වා ඇති එකෙල්ල ආකාරය කුමක්ද?
2) “word processing ” නම් මාතෘකාව සඳහා යොදා ඇති සැරසිලි ආකාරයට භාවිත කර ඇති මෙවලම (tool) කුමක්ද?
3) ඉහත 1 2 ප්‍රශ්න සඳහා පිළිතුරු වලට ඇතුලත් නොවන මෙම ලේඛනයේ හමුවන වෙනත් පහසුකම් පහක් සඳහන් කරන්න. වෙනත්
4) ස්මාර් ට් ජංගම දුර කථන වල සහ වළාකුළු පරිගණක සංකල්පය ආශ්‍රිතව භාවිත කල හැකි වදන් සැකසුම් මෘදුකාංග සඳහා උදාහරණය බැගින් සඳහන් කරන්න.

5) වදන් සැකසුම් මෘදුකාංග වල හමුවන තැපැල් මුසුව (mail merge) පහසු කමෙහි ප්‍රයෝජනය කෙටියෙන් පැහැදිලි කරන්න.

7. SNS Holdings නම් සමාගමේ සේවයේ නියුතු සේවකයන්ගේ මාස හයක පැමිණීම අධ්‍යයනය කිරීම සඳහා සකස්කරන ලද පැතුරුම්පත් සටහනක් පහත දැක්වේ සේවක අංකයමාසය අනුව පැමිණි ,නම , දින ගණන පැතුරුම්පත තුල අන්තර් ගත කර ඇත. මෙම සටහන හොඳින් අධ්‍යයන කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .

	A	B	C	D	E	F	G	H	I	J
1			SNS Holdings - Attendace Summary							
2			මාසය							
3	සේවක අංකය	නම	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	පැමිණි මුළු දින ගණන	පැමිණීමේ සාමාන්‍ය අගය
4	6452	කමල් ගුණවර්ධන	25	26	24	20	21	25		
5	6453	සුරේන් දිසානායක	23	25	23	19	22	24		
6	6513	දිලංක ද සිල්වා	20	26	25	20	24	24		
7	6515	අදිත අශාන්ත	26	25	24	21	23	25		
8	6544	රශ්මි කමල්දින්	23	24	25	18	24	24		
9										
10								වැඩිම සාමාන්‍ය අගය =		
11								අඩුම සාමාන්‍යය අගය =		

i. “කමල් ගුණවර්ධන” නම් සේවකයා පැමිණි මුළු දින ගණන ලබාගැනීම සඳහා **I4** කෝෂයට ඇතුලත් කරන ශ්‍රිතය (formula) හෝ සූත්‍රය)function) ලියා දක්වන්න.

ii. ඉහත ඔබ ලබාගත් ශ්‍රිතය/සූත්‍රය ඇසුරින් ඉතිරි එක් එක් සේවකයන්ගේ පැමිණි මුළු දින ගණන ලබා ගතහැකි ක්‍රමයක් **පියවර වශයෙන්** යෝජනා කරන්න.

iii. J1 කෝෂයට “කමල් ගුණවර්ධනගේ” පැමිණීමේ සාමාන්‍ය අගය ලබාගත යුතුය ඒ සඳහා ඔබ ඇතුලත් කරන සූත්‍රය (formula) කුමක්ද ?

iv. පැමිණීමේ අඩුම සාමාන්‍ය අගය හා පැමිණීමේ වැඩිම සාමාන්‍ය අගය පිළිවෙලින් J10 හා J11 කෝෂ වෙත ලබාගත යුතුය . ඒ සඳහා ඔබ භාවිතා කරන ශ්‍රිත)formula) පිළිවෙලින් ලියා දක්වන්න.

v. මෙම පැතුරුම්පතෙහි නිරූපනය කර ඇති දත්ත අදාල සමාගමේ ප්‍රධානියාට ප්‍රස්තාරිකව (Graphically) නිරූපනය කල යුතුය . ඒ සඳහා ඔබ යෝජනා කරන ප්‍රස්ථාර වර්ගය කුමක්ද?